6 ලාභ අරමුණු කර නොගත් සංවිධාන

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

6.1 ලාභ අරමුණු කර නොගත් සංවිධාන හැඳින්වීම

6.2 ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස සාමාජික මුදල්

6.3 ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම්

- ❄ ලැබීම් සහ ගෙවීම් ගිණුම
- ❄ ආදායම් සහ වියදම් ගිණුම

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම් පිළියෙල කරමු.

සඳපානගල විද්‍යාලයේ ආදි සිසු සිසුවියන් සිකුරාද දිනයක සවස පාසලට එක් රැස් වූයේ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය පිහිටුවා ගැනීම සඳහා ය. එම සංගමය පිහිටුවා ගැනීමට තීරණය කරන ලද්දේ ....

- ❋ තම පාසලේ භෞතික සම්පත් වැඩි දියුණු කිරීම
- ❋ දක්ෂ සිසුනට මුදලින් හා ඉගෙනුම් ආධාරක මගින් සහාය වීම
- ❋ විද්‍යාලයේ ආර්ථික දුෂ්කරතා ඇති සිසුනට ශක්තියක් වීම
- ❋ ක්‍රීඩා කෞශල්‍යය ඔප්නැංවීම සඳහා උපකාරී වීම ආදි කරුණු මුල්කොට ගෙනය.

පාසල් වියේ දී විවිධ නිලතල දැරූ සමන්ත සංගමයේ ලේකම් ලෙස යෝජනා සම්මත විය. අනෙකුත් තනතුරු සඳහා ඉතා ම සුදුසු නිලධාරීන් පත්කර ගන්නා ලද නමුදු භාණ්ඩාගාරික තනතුර සඳහා වෛද්‍යවරයෙකු වූ සම්පත්ගේ ද ගණකාධිකාරිවරයෙකු වූ වික්‍රමගේ ද නම් යෝජනා විය.

භාණ්ඩාගාරික තනතුර සඳහා මේ දෙදෙනාගෙන් එක් අයෙකු තෝරා පත්කර ගැනීමට ඡන්ද විමසීමක් පැවැත්විය යුතු යැයි තීරණය කරන ලදී.

මෙම අවස්ථාවේ දී සභාව ඉදිරියේ නැගී සිටි වෛද්‍ය සම්පත් විසින් කරන ලද ප්‍රකාශය කාගේත් පැසසුමට ලක්විය.

"මේ තනතුරට මගේ නම යෝජනා කළාට බොහොම ස්තුතියි. මට මේ අවස්ථාවේ අපේ පාසල් ජීවිතය මතක් වෙනවා. සමාන්‍ය පෙළ සමත් වෙලා උසස් පෙළට යන තුරු මමත් වික්‍රමත් හිටියේ එකම පන්තියේ. අපි සාමාන්‍ය පෙළ පන්තියේ වාණිජ විෂය ඉතා ආශාවෙන් කළ බව මට හොඳට මතකයි. ඒ කාලේ තිබුණ වාණිජ ශිෂ්‍ය සංගමයේ අපි හොඳ උද්යෝගිමත් සමාජිකයන්. එදත් භාණ්ඩාගාරික ලෙස හිටියේ වික්‍රම. ඒ කාලේ අපේ සමිතියේ ක්‍රියාකාරකම් මේ ප්‍රදේශය පුරාම ප්‍රසිද්ධ වෙලා තිබුණා. අපේ සංගමයේ අරමුදල් තරකර ගන්න අපි බොහෝ දේවල් කළා. වෙළෙඳ පොළවල්, විවිධ ප්‍රසංග පැවැත්වුවා. මේ හැම දේක ම ගණන් තිබ්බේ වික්‍රම. එම කටයුතුවල නිරවද්‍යතාව ක්‍රමානුකූල බව පිළිබඳ අපේ වාණිජ ගුරුතුමා දිගින් දිගට ම ප්‍රසංශා කළා මට හොඳට මතකයි. වික්‍රම දැන් වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙක්. වික්‍රම තමයි මේ සඳහා සුදුසු ම පුද්ගලයා. නැවතත් මම මගේ නම යෝජනා කිරීම ගැන ස්තුති කරලා ඡන්ද විමසීමට පෙර මගේ නම ඉල්ලා අස්කර ගන්නවා."

ඉහත සඳහන් කොටස කියා වූ ඔබට ඕනෑම සංවිධානයක මූල්‍ය කටයුතු පිළිබඳ ව විධිමත් ව හා ක්‍රමානුකූල ව සටහන් තබා ගත යුතු බව අවබෝධ වන්නට ඇත. මෙම පරිච්ඡේදය මගින් සමාජ සුබසාධනය ප්‍රධාන අරමුණ කොටගත් සංවිධානයක ගිණුම්කරණ කටයුතු සිදු වන්නේ කෙසේ දැයි සාකච්ඡා කෙරේ.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

හැඳින්වීම

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට ඉදිරිපත් වන ඇතැම් සංවිධාන ලාභ ඉපයීමේ අරමුණින් නොව සමාජ සුබ සාධනය ඉටු කිරීමේ අරමුණ ඇති ව පවත්වා ගෙන යනු දක්නට ලැබේ. එවැනි සංවිධාන ද විවිධ ආකාරයෙන් මුදල් සම්පාදනය කර ගන්නා අතර විවිධ කටයුතු වෙනුවෙන් මුදල් යොදවනු ලැබේ. මෙම සංවිධානවලට සාමාජිකයන් වශයෙන් එකතු වන සෑම පුද්ගලයෙක් ම මුදල් කළමනාකරණයට සහභාගීවන්නේ නැත. එම නිසා සාමාජිකයන්ගේ මෙන් ම අනෙකුත් පාර්ශ්වයන්ගේ ද දැනුවත් බව සඳහා සමිතියේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විධිමත් ගිණුම්කරණ ක්‍රියාවලියක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. මෙම පරිච්ඡේදය මගින් ලාභ අනපේක්ෂිත සංවිධාන පිළිබඳවත් ඒවායේ ආර්ථික කටයුතු පොත්වල සටහන් කිරීම පිළිබඳවත් අවබෝධයක් ලැබෙනු ඇත.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කෙරේ.

- සාමාජික මුදල්
- යාවජීව සාමාජික මුදල්
- ලැබීම් හා ගෙවීම් ගිණුම
- ආදායම් හා වියදම් ගිණුම
- ඌනතාව
- අතිරික්තය
- සමුච්චිත අරමුදල

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

6.1 ලාභ අරමුණු කර නොගත් සංවිධාන හැඳින්වීම

අද බොහෝ ව්‍යාපාර සංවිධාන ලාභ අරමුණු කොටගෙන පවත්වා ගෙන යනු දැකිය හැකි ය. එහෙත් ලාභ සංකල්පය ප්‍රධාන කර නොගෙන වෙනත් පරමාර්ථ ප්‍රමුඛ කොට ගෙන පවත්වා ගෙන යනු ලබන සංවිධාන ද අද දක්නට ලැබේ. සමාජ සුබ සාධනය අරමුණු කර ගෙන පවත්වාගෙන යනු ලබන සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස ගිණුම්කරණයේ දී හඳුනාගනී.

මෙම සංවිධානවල පරමාර්ථ වනුයේ

- සාමාජිකයින්ගේ අභිවෘද්ධිය හා සුබ සාධනය
- සමාජ සම්බන්ධතා වර්ධනය යි.

ඔබේ පාසලේ පවත්වාගෙන යන විවිධ සංවිධාන පිළිබඳ ව සිතන්න.

බෞද්ධ සංගමය, වාණිජ සංගමය, මුස්ලිම් මජ්ලිස් (සංගමය) දෙමළ සාහිත්‍ය සංගමය එම සමිති සංවිධානවලට නිදසුන් කිහිපයකි. මෙම සංවිධානවල මූලික පරමාර්ථය වනුයේ සාමාජික අභිවෘද්ධිය හා සාමාජික සම්බන්ධතා වර්ධනය කිරීම යි.

එමෙන් ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ පවතින අවමංගල්‍යාධාර සමිති, වෘත්තීය සමිති, ආගමික සංවිධාන හා ක්‍රීඩා සමිති මෙම සංවිධානවලට නිදසුන් ය. මෙම සංවිධාන පිහිටුවීමේ මූලික අරමුණ ලාභ ඉපයීම නොවූවත් මෙම සංවිධාන ද විවිධ ආර්ථික කටයුතුවල නිරත වනු දැකිය හැකි ය.

නිදසුන්
- සාමාජික මුදල් එකතු කිරීම
- ආපනශාලා පවත්වා ගෙන යාම
- කොඩි විකිණීම, සංදර්ශන පැවැත්වීම ආදිය මගින් මුදල් රැස් කිරීම
- විවිධ පුද්ගලයන්ගෙන් හා සංවිධානවලින් පරිත්‍යාග ලබා ගැනීම
- සුවිශේෂ අවස්ථාවල සාමාජිකයන්ට මුදලින් ආධාර කිරීම

ඉහත දක්වන ලද නිදසුන්වලට අනුව මෙම සංවිධාන ද කිසියම් ක්‍රමයක ආදායම් ඉපයීමක් ද වියදම් දැරීමක් ද සිදු කරයි. මෙම මූල්‍ය ක්‍රියා පිළිබඳ ව සාමාජිකයන් දැනුවත් කළ යුතු ය. එම කටයුතු සම්බන්ධයෙන් ගිණුම්කරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යා යුතු ය.

ක්‍රියාකාරකම 01

1. ඔබ ජීවත්වන ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සුභසාධක සංගම් කිහිපයක් සඳහන් කරන්න. ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කරන්න.
   i. එම සංගම් අරමුදල් ලබා ගන්නා මාර්ග පිළිබඳ විමසා බලන්න.
   ii. එම අරමුදල් ලැබීම් වැඩි දියුණු කිරීමේ මාර්ග යෝජනා කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

2. i. ඔබ විද්‍යාලයේ පිහිටුවා ඇති විවිධ සංගම් පිළිබඳ තොරතුරු සොයා බලා ඒවා මගින් සිදු කරනු ලබන සුභසාධක වැඩ සටහන් ලයිස්තුවක් පිළියෙල කරන්න.
ii. විද්‍යාලයීය සංගම්වල වැදගත්කම පිළිබඳ ව වාර්තාවක් පිළියෙල කොට එය පාසලේ උදෑසන රැස්වීමේ කතාවක් ලෙස ඉදිරිපත් කරන්න.

සුභ සාධක සංගමයක් මගින් ලේ දන් දීමේ
වැඩ සටහනක යෙදෙන අවස්ථාවක්

6.2 ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස සාමාජික මුදල්

ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ සාමාජිකයන්ගෙන් අය කර ගනු ලබන සාමාජික මුදල් **(Subscription)** ය. මෙම මුදල් ප්‍රමාණය හා ඒවා එකතු කර ගන්නා ආකාරය සාමාජිකයන්ගේ රැස්වීම්වල දී යෝජනා ස්ථිරත්වයෙන් තීරණය කරනු ලැබේ. එම මුදල් මාසික ව හෝ වාර්ෂික ව හෝ සමිතියේ භාණ්ඩාගාරික වෙත ගෙවා ලදු පතක් ලබා ගත යුතු ය. සමහර සංවිධාන විසින් මුළු ජීවිත කාලය සඳහා ම සාමාජික මුදල් එක වරකින් ගෙවීමට සාමාජිකයන්ට පහසුකම් සලසා තිබේ. මෙම සාමාජික මුදල් **යාවජීව සාමාජික මුදල්** ලෙස හඳුන්වනු ලැබේ.

සාමාජික මුදල් ගණනය කිරීම

ගිණුම් පිළියෙල කරනු ලබන නිශ්චිත කාලච්ඡේදයකට අදාළ ව සාමාජික මුදල් ආදායම ගණනය කළ යුතු ය.

සාමාජික මුදල් ආදායම = සාමාජිකයන් ගණන x එක් සාමාජිකයකුගේ සාමාජික මුදල

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

නිදසුන් • සමගි ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් ගණන 130කි. එක් අයෙකුගෙන් රු. 200ක වාර්ෂික සාමාජික මුදලක් අය කරනු ලැබේ.

වර්ෂයේ සාමාජික මුදල් ආදායම = 130 x 200 = රු. 26,000

උපචිත සංකල්පය අනුව කාලච්ඡේදයට අදාළ ව ලැබුණා හෝ නොලැබුණා හෝ සියලු ම සාමාජික මුදල් එම කාලච්ඡේදයේ ආදායම ලෙස සලකන බව ඔබ දැනටමත් දන්නා කරුණකි.

පහත දක්වෙන නිදසුන බලන්න.

සමනළ ඔය ග්‍රාමයේ අවමංගල්‍යාධාර සමිතියට බැඳුණු සාමාජිකයන් ගණන 655ක් විය. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 150කි. සාමාජිකයන් 10දෙනෙක් 20XX වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නො තිබුණි.

20XX වර්ෂයේ සාමාජික මුදල් ආදායම වනුයේ

ලද මුදල		හිඟ මුදල
645 × රු. 150	+	10 × රු. 150
රු. 96,750	+	රු. 1, 500
	රු. 98,250	

ක්‍රියාකාරකම 02

එක්සත් ක්‍රීඩා සමාජයට 20XX වර්ෂයේ බැඳුණු සාමාජිකයින් සංඛ්‍යාව 150ක් විය. සාමාජිකයකුගෙන් අය කරනු ලබන වාර්ෂික සාමාජික මුදල රු.200කි. සාමාජිකයන් 12 දෙනෙක් වර්ෂය අවසාන වන දිනට සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

i. 20XX වර්ෂය සඳහා ලද සාමාජික මුදල ගණනය කරන්න.

ii. 20XX වර්ෂයට අදාළ මුළු සාමාජික මුදල කොපමණ ද ?

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ගිණුම්

මෙවැනි සංවිධානයක පිළියෙල කරනු ලබන ප්‍රධාන ගිණුම් වර්ග දෙකක් දැක්විය හැකි ය.

1. ලැබීම් හා ගෙවීම් ගිණුම
2. ආදායම් හා වියදම් ගිණුම

මෙයට අමතර ව සංවිධානයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා ශේෂ පත්‍රය ද පිළියෙල කරනු ලැබේ.

ලැබීම් සහ ගෙවීම් ගිණුම (Receipts and Payment Account)

ලාභ අරමුණු කර නොගත් සංවිධානවල කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ සියලු ම මුදල් ලැබීම් සහ සියලු ම මුදල් ගෙවීම්වල සාරාංශගත සටහන ලැබීම් සහ ගෙවීම් ගිණුම ලෙස හැඳින්වේ. මෙය වත්කම් ගිණුමකි. එබැවින් මුදල් ලැබීම් හරටත් මුදල් ගෙවීම් බැරටත් සටහන් කරනු ලැබේ. මෙය බොහෝ දුරට මුදල් පොතට සමාන ගිණුමක් වේ. මුදල් පොතෙහි එකිනෙක අයිතමයේ ගනුදෙනු වෙන වෙන ම දින අනුපිළිවෙල අනුව ඒවා සිදු වූ අවස්ථාවේ දී ම සටහන් කරන නමුදු ලැබීම් සහ ගෙවීම් ගිණුමේ මුදල් ලැබීම් හා ගෙවීම් එක එක අයිතමයේ එකතු වශයෙන් සටහන් කරනු ලැබේ.

පහත දැක්වෙන නිදසුන පරීක්ෂා කරන්න.
"සත්මිණි" ක්‍රීඩා සමාජයේ 20XX වර්ෂයේ ලැබීම් සහ ගෙවීම්වලට අදාළ සාරාංශගත කරන ලද තොරතුරු පහත දැක්වේ.

		රු.
20XX.01.01	මුදල් ශේෂය	4,350
	ලද සාමාජික මුදල්	35,000
	සංගීත සංදර්ශනයෙන් ලැබීම්	46,000
	පරිත්‍යාග ලැබීම්	25,000
	පරණ පුවත්පත් විකිණීමෙන්	900
	පුවත්පත් මිලදී ගැනීම	4,000
	සංගීත සංදර්ශනයට වියදම්	34,500
	ක්‍රීඩාපිටිය නඩත්තු වියදම්	5,600
	ක්‍රීඩා උපකරණ මිලට ගැනීමට	20,000
	විදුලිය වියදම්	600
	ලිපි ද්‍රව්‍ය සඳහා	400
	ක්‍රීඩකයන්ට මුදලින් කළ පරිත්‍යාග	20,000

මෙම තොරතුරු උපයෝගි කොට ගෙන 20XX වර්ෂයට අදාළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වෙන පරිදි පිළියෙල කළ හැකි ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

20XX.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

විස්තරය	මුදල්	විස්තරය	මුදල්
ඉ/ගෙ ශේෂය	4,350	පුවත්පත් සඳහා	4,000
සාමාජික මුදල්	35,000	සංගීත සංදර්ශනයට	34,500
සංගීත සංදර්ශනයෙන්	46,000	ක්‍රීඩා පිටිය නඩත්තුව	5,600
පරිත්‍යාග ලැබීම්	25,000	ක්‍රීඩා උපකරණ මිලට ගැනීම	20,000
පුවත්පත් විකිණීමෙන්	900	විදුලි බිල	600
		ලිපි ද්‍රව්‍ය	400
		ක්‍රීඩකයන්ට පරිත්‍යාග	20,000
		ශේ/ප/ගෙ	26,150
	111,250		111,250
ශේ /ඉ/ගෙ	26150		

ක්‍රියාකාරකම 03

මිණිකැට ළමා සමාජයේ 20xx ජනවාරි මාසයට අදාළ විස්තර කිහිපයක් එහි භාණ්ඩාගාරික සුපුනි විසින් ඔබට ඉදිරිපත් කර ඇත.

සාමාජික සංඛ්‍යාව 200කි.

මාසික සාමාජික මුදල්	රු. 10
පෑන් 02ක් මිලට ගැනීමට	රු. 50
අභ්‍යාස පොත් 02ක් මිලට ගැනීමට	රු. 120
මල් පෝච්චියක් ගත්තා	රු. 70
ළමා සඟරාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලට ගැනීමට	රු. 400
සඟරා බැඳීමේ වියදම්	රු. 300
සඟරා විකිණීමෙන් ලද මුදල	රු. 1,100
නාගොඩ විද්‍යායතනයට සඟරා විකිණීමෙන් ලැබිය යුතු මුදල	රු. 300

ළමා සමාජයේ සභාපති වූ කදීර් තම මුදල් වියදම් කොට සඟරා සැකසීම සඳහා රු.220ක් වටිනා තීන්ත බෝතල් 02ක් මිල දී ගෙන තිබුණි. ජීවන්ත, හකීම්, සුකේන්ද්‍රන්, සිනාල්, කොල්වින් යන සාමාජිකයන් ජනවාරි 31 දින වන විට සාමාජික මුදල් ගෙවා තිබුණේ නැත.

මිණිකැට ළමා සමාජයේ 20xx12.31 දිනට ලැබීම් සහ ගෙවීම් ගිණුම පිළියෙල කරන්න.

ක්‍රියාකාරකම 04

පහත දැක්වෙන්නේ පෙර මග ක්‍රීඩා සමාජයේ භාණ්ඩාගාරික විසින් මුදල් ලැබීම් සහ ගෙවීම් තම දින පොතේ සටහන් කර ගත් ආකාරයයි. මේ කරුණුවලින් 20xx. වර්ෂයේ ප්‍රථම මාස තුන සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න.

ඔහු 20xx. ජනවාරි 01 දින අත ඉතිරි මුදල රු. 9,250ක් වූ බව අනාවරණය කළේ ය.

1/1	බදු කුලී ගෙව්වා	300/-	2/1	බදු කුලී ගෙව්වා	රු. 300/-
1/3	සාමාජික මුදල්	450/-	2/4	ක්‍රීඩා සංවත්සර වියදම්	රු 2000/-
1/4	සාමාජික මුදල්	200/-	2/7	සාමාජික මුදල්	රු 700/-
1/7	විදුලිය සඳහා	350/-	2/9	සංවත්සර වියදම්	රු 1000/-
1/9	වේතන ගෙව්වා	600/-	2/11	පත්කර විකිණීමෙන්	රු 250/-
1/10	බෝලයක් ගත්තා	750/-	2/20	සාමාජික මුදල්	රු 750/-
1/14	පරිපාලක වේතන	1000/-	2/23	සංවත්සර වියදම්	රු 230/-
1/16	සාමාජික මුදල්	4000/-	2/26	විදුලි බිල	රු 120/-
1/20	සංග්‍රහ වියදම්	720/-	2/28	සාමාජික මුදල්	රු 1050/-
1/24	සාමාජික මුදල්	950/-	3/02	මුදල් පරිත්‍යාග ලැබුණ	රු 4000/-
1/27	ජල බිල	200/-	3/10	සංවත්සර ආදායම්	රු 9000/-
1/30	පුවත් පත් සඳහා	620/-	3/16	සාමාජික මුදල්	රු 950/-
1/31	ක්‍රීඩා උපකරණ	3000/-	3/28	සංවත්සර ආදායම්	රු 2050/-

ආදයම් හා වියදම් ගිණුම (Income and Expenditure Account)

ලාභ අරමුණු කර නොගත් සංවිධාන විසින් නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ගණනය කිරීම සඳහා සකස් කරනු ලබන ගිණුම **ආදයම් සහ වියදම් ගිණුම** නමින් හැඳින්වේ. මෙය ලාභ අපේක්ෂිත ව්‍යාපාර විසින් සකස් කරනු ලබන ලාභාලාභ ගිණුමට බොහෝ දුරට සමාන වේ. එබැවින් ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු ගිණුම්කරණ නීති රීති මෙම ගිණුම පිළියෙල කිරීමේ දී ද අනුගමනය කළ යුතු වේ.

ආදයම් හා වියදම් ගිණුමේ අවසාන ප්‍රතිඵලය අතිරික්තය **(Surplus)** හෝ ඌනතාව **(Deficit)** නමින් හැඳින්වේ. එහි වියදමට වැඩි ආදයම අතිරික්තය වන අතර

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආදායමට වැඩි වියදම ඌනතාව නම් වේ. අතිරික්තය හෝ ඌනතාව සංවිධානයේ **සමුච්චිත අරමුදලට (Accumulated Fund)** මාරු කරනු ලැබේ.

සමුච්චිත අරමුදල යනු ලාභ අනපේක්ෂිත සංවිධානවල ආදායම්වලින් වියදම් දැරීමෙන් පසු ඉතිරි වන අතිරික්ත ශේෂයන් එක් රැස්වීමෙන් ගොඩනැගෙන අරමුදල ලෙස සරලව හැඳින්විය හැකි ය. ඌනතාවක් ඇති වූ විට මෙම අරමුදල අඩු වීම කෙරෙහි බලපායි. සමුච්චිත අරමුදල සංවිධානයේ මූල්‍ය ශක්තිය පෙන්නුම් කරයි.

ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ආදායම් මාර්ග ස්වරූප අතර බොහෝ විට එතරම් වෙනසක් නොවුන ද වියදම් මාර්ගවල ස්වරූප එම සංවිධානවල පරමාර්ථ අනුව වෙනස් විය හැකි ය.

නිදසුන
- අවමංගල්‍යාධාර සමිති අවමංගල්‍ය කටයුතු සඳහා වියදම්
- පාසල් ආදී ශිෂ්‍ය සංගම් තම පාසලේ අභිවෘද්ධිය සඳහා වන වියදම්
- ක්‍රීඩා සමිති ක්‍රීඩා කෞශල්‍ය ඔප් නැංවීම සඳහා වන වියදම්

පහත දැක්වෙන නිදසුන පරීක්ෂා කරන්න.

"දහම් මග" බෞද්ධ සංගමයේ භාණ්ඩාගාරික තැන විසින් 20xx .12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන තොරතුරු ඉදිරිපත් කර ඇත.

සාමාජික මුදල් ලැබීම්	රු. 5,600
මුදල් පරිත්‍යාග ලැබීම්	රු. 9,000
සංග්‍රහ කිරීමේ වියදම්	රු. 6,000
විවිධ පුණ්‍ය කටයුතු සඳහා	රු. 4,500
විදුලි බිල	රු. 1,200
පුවත් පත් මිල දී ගැනීමට	රු. 2,000
පරණ පුවත් පත් විකිණීමෙන්	රු. 160
පරිත්‍යාග කිරීම්	රු. 2,000

පහත දැක්වෙන තොරතුරු ද උපයෝගි කොට ගෙන 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කරන ආකාරය වටහා ගනිමු.

1. අදළ වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු සාමාජික මුදල රු. 2,100
2. 20xx.12.31 දිනට ගෙවිය යුතු විදුලි බිල රු. 300

හර **ආදායම් හා වියදම් ගිණුම** බැර

සංග්‍රහ වියදම්	6,000	සාමාජික මුදල්	7,700
පුණ්‍ය කටයුතු සඳහා	4,500	පරිත්‍යාග	9,000
විදුලි බිල	1,500	පරණ පුවත්පත් විකිණීම	160
පුවත් පත් සඳහා	2,000		
පරිත්‍යාග කිරීම්	2,000		
අතිරික්තය ස. අරමුදලට බැර කළා	860		
	16,860		16,860

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ක්‍රියාකාරකම් 05

පහත දැක්වෙන්නේ "සරණ" ක්‍රීඩා සමාජයේ 20xx12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුමයි.

ලැබීම් සහ ගෙවීම් ගිණුම

20xx.01.01 දින ශේෂය	19,800	සංදර්ශන වියදම්	11,250
සාමාජික මුදල්	24,200	පුවත් පත් මිලට ගැනීමට	2,000
ක්‍රීඩා සංදර්ශනයෙන්	16,000	වාර්ෂික ශිෂ්‍යත්ව සඳහා	10,000
මුදල් පරිත්‍යාග	4,000	ගොඩනැගිලි කුලි	4,000
		ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම	3,000
		ක්‍රීඩා පාලක වේතන	12,000
		විදුලි බිල	700
		දුරකථන බිල	1,300
		ක්‍රීඩා උපකරණ මිලට ගැනීම	5,000
		ශේෂය ප/ගෙ	14,750
	64,000		64,000
ශේෂය ඉ/ගෙ	14,750		

1. 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරණ ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කරන්න.
2. 20xx.01.01 දිනට සමාජයේ සමුච්චිත අරමුදල රු. 12,700 ක් වූයේ නම් 20xx.12.31 දිනට එය වෙනස් වූ ආකාරය දක්වන්න.

ක්‍රියාකාරකම් 06

නිල්වලා පාඨක සමාජයේ ලේකම්වරයා 20xx වර්ෂයට අදළ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරයි.

පාඨක සමාජයේ සාමාජික සංඛ්‍යාව 200
එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100ක් වූ අතර අදළ වර්ෂයේ 12.31 දිනට නොලැබුණු සාමාජික මුදල රු. 1,500කි.

එයට අමතර ව පහත සඳහන් ගනුදෙනු වර්ෂය තුළ සිදු වී ඇත.

මුදල් ලැබීම්

පාඨක දඩ ගාස්තු	රු. 530
සංවත්සර ආදායම්	රු. 4,800

මුදල් ගෙවීම්

සේවක වේතන	රු. 15,000
විදුලිය	රු. 3,200
ජල බිල්පත්	රු. 6,00
විදුලි බුබුලු සඳහා	රු. 3,100

20xx.01.01 දිනට ඉතිරි මුදල්	රු. 500
ගොඩනැගිලිවල අගය	රු. 20,000
20xx.12.31 දිනට ඉතිරි මුදල්	රු. 2,430
ගොඩනැගිලිවල අගය	රු. 18,000

ඉහත පාඨක සමාජයේ භාණ්ඩාගාරික ඔබ යැයි උපකල්පනය කොට 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

i. ලැබීම් හා ගෙවීම් ගිණුම
ii. ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කරන්න.

ක්‍රියාකාරකම් 07

i. ජනතාවට වැඩි යහපතක් සැලසීම සඳහා සුභ සාධක සංගම් මගින් කළ හැකි යැයි ඔබ යෝජනා කරන සේවාවන් ලැයිස්තුවක් පිළියෙල කරන්න.

ii. ඒවා ක්‍රියාත්මක කළ හැකි ආකාරය ද කෙටියෙන් සඳහන් කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.